## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss - 2022)

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 6 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **6 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 01. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිළි කරයි. | 1.1 ජනකතා පොත් ඇසුරෙන් ජනකතා ශබ්ද නගා කියවයි. | ▪ ජනකතා යනු කුමක්දැයි හඳුන්වමින් ජනකතා කිහිපයක් නම් කරයි.<br>▪ ජනකතා ශ්‍රවණය කරමින් වින්දනයක් ලබයි.<br>▪ ජනකතා මගින් ජීවිතයට විවිධ ආදර්ශයන් ලබාගත හැකි බව පවසයි. | ▪ සපයා ඇති ජනකතා ශබ්දනගා කියවීම. | 1.1. සපයන ලද ජන කතා ශබ්ද නගා කියවයි. | 01 |
| | 1.2 කියවන ලද කතාන්දර වාචිකව ඉදිරිපත් කරයි | ▪ විවිධ ජනකතා එක් රැස් කිරීමට කැමැත්ත පල කරයි.<br>▪ අර්ථය උද්දීපනය වන අයුරින් ජන කතා ඉදිරිපත් කරයි. | ▪ කියවන ලද ජනකතා ප්‍රකාශනාත්මක ව ඉදිරිපත් කිරීම. | 1.2 'කතන්දර කියමු'' | 01 |
| | 1.3 ස්වාභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් ඇසුරෙන් අනුකරණයට යොමු වෙයි | ▪ අනුකරණය අර්ථ දක්වයි.<br>▪ තනි ව හෝ සාමූහික ව පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් අනුකරණය කරයි. | ▪ ස්වභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් අනුකරණය කිරීම. | 1.3 ''පරිසරය දකිමු - රඟමු - විඳිමු''. | 01 |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිකල්පනය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණ කරණයෙහි යෙදෙයි. | 2.1 අත්දැකීම් පාදක කොට ගනිමින් පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණකරණයෙහි යෙදෙයි. | ▪ ස්වාභාවික පරිසරයෙහි දැකිය හැකි වස්තූන් හඳුනාගෙන නම් කරයි.<br>▪ පරිසරය පිළිබඳ ගී, කවි , රචනා රස විඳීමට කැමැත්ත පල කරයි.<br>▪ සුන්දර පාරිසරික ස්වභාවයන් නිර්මාණාත්මක ව අනුකරණය කරයි. | ▪ නිර්මාණාත්මක රංග ක්‍රියාවල යෙදීම. | 2.1 සවභාවික පරිසරයේ දැකිය හැකි වස්තූන් පාදකනොට ගනිමින් නිර්මාණකර ණයෙහි යෙදීම. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2.2 පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි පාදක කොට ගෙන නිර්මාණාත්මක රංග ක්‍රියාවන්හි යෙදෙයි | ▪ තෝරා ගත් අවස්ථා හෝ සිද්ධීන් නව පරිකල්පනයෙන් යුක්ත ව රංගනය සඳහා යොදාගත හැකි බව පිළිගනිමින් අදහස් දක්වයි.<br>▪ පරිසරය ආශ්‍රිත අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරයි. | ▪ පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි පාදක කොටගෙන නිර්මාණාත්මක රංග<br>▪ ක්‍රියාවන්හි යෙදෙයි. | 2.2 ඇසූ පිරූ තැන් ඇසුරින් රංගනයේ යෙදීම. | 01 |
| | 2.3 පරිසරය ආශ්‍රිත අත්දැකීම් ඇසුරෙන් සාමූහික ව, නිර්මාණාත්මක රංගනයන්හි යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | ▪ විවිධ භූමිකා නම් කරයි.<br>▪ පුද්ගලයකුට සිය ජීවිත කාලය තුළ විවිධ භූමිකා අනුව කටයුතු කිරීමට සිදුවන බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ එක් පුද්ගල චරිතයක භූමිකා රැසක් ඇති බව රංගනයෙන් ආදර්ශනය කරයි. | ▪ විවිධ චරිත ස්වභාවයන් ඉස්මතු වන පරිදි සාමූහික ව රූපණයේ යෙදීම. | 2.3 විවිධ මිනිස් භූමිකා රඟ දක්වමු. | 01 |
| | 2.4 සත්ත්ව චර්යාවන් අනුකරණය කරමින් ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි | ▪ සත්ත්වයින් ගේ හැසිරීම් එකිනෙකාගෙන් වෙනස් වන බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ සත්ත්වයින් ගේ වුව ද යහපත් චර්යාවන් ජීවිත යහපත් කර ගැනීම සඳහා ආදර්ශ බවට පත් කරගත හැකි බව පිළිගෙන අදහස් දක්වයි.<br>▪ සත්ත්ව චර්යා ඇසුරෙන් ක්ෂණික නිරූපණ ඉදිරිපත් කරයි. | ▪ සත්ත්ව චර්යාවන් අනුකරණය කරමින් ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. | 2.4 සත්ත්ව චර්යාවන් අනුකරණයෙන් ක්ෂණික නිරූපණයන් හි යෙදෙයි. | 01 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් | 3.1 තෝරා ගත් නාට්‍ය පෙළ පිළිබඳ අවබෝධයන් යුතුව සංවාදයේ යෙදෙයි. | ▪ සංවාදවල විවිධ ස්වභාවයන් හඳුනාගෙන ඒ අනුව උච්චාරණය කරයි.<br>▪ අවස්ථාවෝචිත පරිදි සංවාද භාවිත කරයි.<br>▪ අදහස් ප්‍රකට වන අයුරින් සංවාද භාවිත කරයි. | ▪ අවබෝධයෙන් යුතු ව සංවාද භාවිත කිරීම. | 3.1 අවබෝධයෙන් යුතු ව දෙබස් කියවමු. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. | 3.2 මනස හා ශරීරය අතර සම්බන්ධතාව ගොඩනගා ගැනීම සඳහා සංචලන විධි භාවිත කරයි. | ▪ පරිසරයේ විවිධත්වය අනුව සංවේදනයන් වෙනස් වන ආකාරය පැහැදිළි කරයි.<br>▪ විවිධ සංවේනයන්ට අනුරූපීව හැඟීම් උපදින බව පිළිගෙන අදහස් ප්‍රකාශ කරයි.<br>▪ මනස සහ ශරීරය අතර සම්බන්ධතාව ගොඩනගාගැනීම සඳහා වන ක්‍රියාකාරකම්හි නිරත වෙයි. | ▪ රංගනයේදී මනස හා සිරුර අතර සබඳතාව හඳුනා ගැනීම. | 3.2 රංගනයේ දී මනස හා සිරුර අතර සබඳතාව දකිමු. | 01 |
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 ජන සාහිත්‍යයේ එන සරල කතා සහ එහි පසුබිම පිළිබඳව අධ්‍යයනය කරයි. | ▪ ජනකතා ඇසුරෙන් තත්කාලීන සමාජ තොරතුරු හෙළි කරගත හැකි බව පිළිගෙන අදහස් දක්වයි.<br>▪ විවිධ ආගම්වලට අයත් ජනකතා, උපමා කතා ඇසුරෙන් ජීවිතාවබෝධයක් ලැබිය හැකි බව පිළිගෙන අදහස් දක්වයි. | ▪ නාට්‍ය හා රංග කලාවට අදාළ ව ජන සාහිත්‍යයේ පසුබිම විමසීම. (විවිධ ජනවර්ගවලට හා ආගම්වලට අයත් ජන කතා, උපමා කතාවල සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසීම) | 4.1 ජනකතා ඇසුරෙන් ජීවිතය අවබෝධ කර ගනිමු. | 01 |
| | 4.2 ජනකතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | ▪ විවිධ මූලාශ්‍ර ඇසුරින් ජනකතා එක්රැස් කරයි.<br>▪ විවිධ ජනකතා පොතක් නිර්මාණය කරයි.<br>▪ ජනකතාවන්හි ඇති වැදගත්කම පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | ▪ ජනකතා වර්ගීකරණය<br>ගමරාළ හෝ ගොවි ජීවිතය සම්බන්ධ ජනකතා<br>● යෝධයන් හෝ වීර පුරුෂයින් සම්බන්ධ ව ගොඩ නැගුණු ජනකතා<br>● අන්දරේ හෝ වෙනත් විකට චරිත සම්බන්ධ ව ගොඩනැගුණු ජනකතා<br>● ප්‍රස්තාව පිරුළු ඇසුරෙන් ගොඩ නැගුණු ජනකතා<br>● ඉතිහාසයේ විවිධ සිද්ධීන් ඇතුළත් ජනකතා<br>● ආගමික සිද්ධීන් සම්බන්ධ ජනකතා | 4.2 ජනකතා ආශ්‍රිත ක්‍රියාකාරකම් වල නිරත වෙයි. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ ජනකතාවන්හි ජීවන අත්දැකීම් ගවේශණය<br>▪ උපමා කතා ආදියෙහි එන සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි. | | |
| සමස්තය | | | | | 13 |